sinhalaebooks.com

# fiverr®

By Attrex Academy | 100% Free Distribution



sinhalaebooks.com



# පටුන


- මොකක්ද මේ Fiverr කියන්නෙ ?
- කොහොමද Fiverr වලින් සල්ලි හොයන්නෙ ?
- කවුද Fiverr වලින් සල්ලි හොයල තියෙන්නෙ ?
- Account එක හදන්න කලින් මේ ටිකත් දැනගන්න.
- නිවැරදිව Fiverr Account එක හදමු.
- GIG එකක් හදන්න කලින් මේ ටිකත් දැනගන්න.
- නිවැරදිව GIG එක හදමු.
- ඔබේ GIG එක Ranking වල උඩට ගමු.
- Order එක නිවැරදිව Deliver කරමු.
- හොයපු සල්ලි අතට ගමු.
- සාර්ථක වෙන්නෙ TIPS ටිකක්.
- Fiverr වලින් සල්ලි හොයන විදි 36 ක්.

## මොකක්ද මේ Fiverr කියන්නෙ ?

ඇත්තටම **Fiverr** කියන්නෙ සේවා වගේම භාණ්ඩත් විකුනන **online marketplace** එකක්. මේකෙ තියන භාණ්ඩ හා සේවා හැමෝටම **5$** සිට ගන්න වගේම සපයන්නත් පුලුවන්.

**Fiverr** හරහා දිනපතා බොහෝ දෙනෙක් සේවාවන් සහ නිෂ්පාදන මිලදී ගන්නවා.

මෙහි ලබා ගත හැකි සේවාවන් විදිහට ව්‍යාපාර ප්‍රවර්ධනය**(Business Promotion),** සමාජ ජාල**(Social Networking)** සහ වෙළඳ දැන්වීමේ**(Advertisements)** සිට හාස්‍ය වීඩියෝ, ග්‍රැෆික්**(Graphic)** නිර්මාණය සහ පරිවර්තන**(Translation)** දක්වා කිහිපයක් දක්වන්න පුලුවන්.

මෙම පිරිනමන සේවාවන් **Fiverr** හි **“GIGS”** ලෙස හඳුන්වනවා.

මේ විදිහට **Fiverr** කියන්නෙ සේවා බලාපොරොත්තු වෙන අය සහ අපි වගේ සේවාවක් ස්පයන්න යන අය හමුවන තැනක්.

ඔබත් එකට ගිහින්ම බලන්න.

## www.fiverr.com



# කොහොමද Fiverr වලින් සල්ලි හොයන්නෙ ?

**Fiverr** එකෙන් සල්ලි හොයන්න නම් ඔබට කරන්න තියෙන්නෙ නිෂ්පාදනයක් හෝ සේවාවක් විකුණන එක.

ඒ කියන්නෙ ඔබට තියන හැකියාවක් **Service** එකක් විදිහට දෙන්න පුලුවන් කියල අපි **GIG** එකක් හදලා **Fiverr** එකේ දානවා. ඊට පස්සෙ ඒ **Service** එක අවශ්‍යය කෙනෙක් ඇවිත් **Order** කරනවා.ඒ විදිහට තමා අපිට සල්ලි ලැබෙන්නෙ.

ඒකට ඔබ දැනගෙන ඉන්න ඕන මොන වගේ හැකියාවන් ද අපිට තියෙන්නෙ කියල වගේම මොන වගේ **Product** සහ **Services** ද අපිට **Sell** කරන්න පුලුවන් කියලා.

මම උදාහරණ කිහිපයක් දාල තියනව ඔයාල ගිහින් බලන්න,

- **Logo Design** කරන්න පුලුවන්
- **Photo Edit** කරන්න පුලුවන්.
- **Video Edit** කරන්න පුලුවන්.
- **Handcraft** (අත්කම් නිර්මාණ) වගේ දේවල් හදල යවන්න පුලුවන්.
- **Translations** කරන්න පුලුවන්.
- **PDF Files create** කරන්න පුලුවන්.

මේ දේවල් වලට අමතරව තව ගොඩක් දේවල් කරන්න පුලුවන් ඒ දේවල් අපි තව ටිකකින් ඉගනගමු.

## GIG එකකින් අපිට කීයක් ලැබෙනවද?

**GIG** එකක වටිනාකමින් **80%** අපිට සහ **20% fiverr** එකට විදිහට තමා ගාන බෙදෙන්නෙ.

ඒ කියන්නෙ ඔයා **5$** ක **GIG** එකක් **Sell** කලා නම් **4$** ක් ඔයාට හම්බවෙනව **, 1$ Fiverr** එක තියාගන්නවා.


මොකද ඔයාට මෙහෙම **Services sell** කරන්න පුලුවන් වෙන්නෙ **Fiverr** එක නිසානෙ.

## කවුද Fiverr වලින් සල්ලි හොයල තියෙන්නෙ ?

සරලවම කිව්වොත් ලංකාව වගේම ලෝකේ වටේම ඉන්නවා **Fiverr** එකෙන් මාසෙකට ලක්ෂ ගණන් උපයන අය. ඔබට මාසෙකට කීයක් උපයන්න පුළුවන්ද කියන එක තීරණය වෙන්නේ ඔබගේ දක්ෂතාවය සහ නිර්මාණශීලිත්වය මත. කිසිදු විශේෂ කුසලතාවයක් නැතුව උනත් ලක්ෂගනන් උපයන්න පුළුවන් නිර්මාණශීලී ක්‍රමෝපායන් තියෙනවා.

පහළ ඇති **screenshot** එකෙන් දළ අදහසක් ගන්න පුළුවන් ඇත්තටම කියක් උපයන්න පුලුවන්ද කියල. මතක තියාගන්න මීට වඩා තව දහස්ගානක් උනත් උපයන්න ඕනෑතරම් අවස්ථාවන් තියෙනවා. මේ පොඩි උදාහරණයක් විතරයි!

රුපියල් වලින් කීයද කියල බලාගන්න මෙතන **click** කරන්න



sinhalaebooks.com



# fiverr®
## Account එක හදමු

### Account එක හදන්න කලින් මේ ටිකත් දැනගන්න.

- මුලින්ම ඔයා කරන්න ඕන **Fiverr** එකේ ඔයා මොනවද කරන්නෙ කියල **Plan** කරන එක. ඒකට ඔයා දැනගන්න ඕන ඇත්තටම ඔයාට මොනවද කරන්න පුලුවන් කියල. ඒකට ඔයා කරන දේට දක්ෂ වගේම ආස වෙන්නත් ඕන. මේ දෙකෙන් තමා ඔයාට මේ වැඩේ කරගෙන යන්න ආසාවක් ඇති වෙන්න.

- ඊලඟට ඔයා **Account** එකට **Username** එකක් දාන්න **short , Creative** වගේම ඔයාගෙ **service** එකට ගැලපෙන නමක් හදාගන්න. **(**උදාහරණයක් විදිහට ඔයා **Logo design** කරන කෙනෙක් නම් **Username** එක **Boss studio** කියල දාන්න පුලුවන්.**)**

- මේ වැඩේට ඔයා ඔයාගෙ පරණ **email** එක **use** කරන්නෙ නැතුව අලුත් **email** එකක් හදාගන්න ඔයා හදපු **username** එකම **Use** කරලා. **( Ex: attrex@gmail.com)**


- එක **Account** එකක් විතරක් හදන්න, ඒ වගේම **IP, country** වෙනස් කරල **Account** හදන්න යන්න එපා.විවිධ **Internet connection** පාවිච්චි කරල **Log** වෙන්න යන්නත් එපා.එක පාරම හොදට හිතල **Account** එක හදන්න.

sinhalaebooks.com


# නිවැරදිව Fiverr Account එක හදමු.

**Account** එක හදන එක ලේසි වැඩක්. ඒඋනාට මත් අර කලින් කිව්ව දේවල් ටික ගැන සැලකිලිමත් වෙන්න ඕන. ඒ දේවල් වලින් තමා **Account** එකේ තියන **Quality** එක වැඩි වෙන්නෙ.

ඔයාලට පුලුවන් **www.fiverr.com** කියන **site** එකට ගිහින් උඩම තියන **Join** කියන එක හරහා **Account** එකක් **Create** කරගන්න.





• **Join** කියන එක **Click** කරහම පහල තියන **Box** එක **open** වෙනව, ඒකට කලින් හදාගත්ත **email** එ ක දීල **Continue Click** කරන්න.





sinhalaebooks.com

• දැන් නව **Box** එකක් **Open** වෙනව, ඒකට කලින් හිතපු **Username** එක දීල **Strong Password** එකකුත් දීල **Join Button** එක **Click** කරන්න.




• දැන් ඔයා **Sign** වෙන්න **Use** කරපු **Email** එකට **Fiverr** එකෙන් **Email** එකක් එවල ඇති ඒකෙ කොළ පාටින් තියන **Activate Your Account** කියන එක **Click** කරන්න. දැන් ඔයා ඒක හරහා එන්නෙ ඔයා **Log** වෙලා ඉන්න **Fiverr** එකටම තමා. දැන් ඔයාගෙ **Account** එක **Active Successfully Activated** කියල කොළ පාට **Bar** එකකින් පෙන්නව.





sinhalaebooks.com


• දැන් කොළ පාට **Bar** එකේ තියන **Edit your Profile** කියන එක **Click** කරන්න.

• ඊලඟට එන **Page** එකේ ඔයාගෙ සම්පූර්ණ නම දාල **Save Changes , Click** කරන්න.





• ඊලඟට ඔයාලගෙ **Account** එකේ ඉතිරි වැඩ ටික කරගන්න, දකුණු පැත්තෙ ඔයාලගෙ **User Account** එක පෙන්නන **Circle** එකට ගිහින් **Settings** වලට යන්න. ඊට පස්සෙ ඒකෙ **Billing Information** වලට යන්න. දැන් මේ **Details** ටික **Fill** කරල **Save Changes Click** කරන්න.






• ඊලඟට අපේ **Seller Profile** එක හදාගන්න ඕන.**Fiverr** එකේ සාර්ථක වෙන්න ඕන නම් මේක වැදගත්. ඒ නිසා ඒකට හොද අවධානයක් යොමුකරන්න ඕන. දැන් දකුණු පැත්තෙ ඔයාලගෙ **User Account** එක පෙන්නන **Circle** එකට ගිහින් **Profile** වලට යන්න.

## දැන් අපි එකේ කොටස් වෙන වෙනම කතා කරමු.





1. Profile Picture – (A)

මේ **Photo** එක තමා අපෙන් **Service** එකක් ගන්න එන කෙනෙක් මුලින්ම දකින්නෙ, ඒනිසා මේ **Photo** එක අපේ **Service** එකට ගැලපෙන විදිහටත්, **Creative** විදිහටත් දාන්න ඕන.


2. What's your story in one line – (B)

මේ කොටසට අපි මොනවද **Service** එක විදිහට දෙන්නෙ කියල.


sinhalaebooks.com





**3. Description –** මේ කොටසට ඔයා ගැන විස්තරයක් කියන්න. ඒ යන්නෙ ඔයා කවුද? , ඔයා මොනවද කරන්නෙ? ඔයාගෙ සුදුසුකම් , ඔයාට කොච්චර අත්දැකීමක් තියනවද මේ **Service** එකට? , ඔයාගෙ **Service** එකෙ තියන විශේෂත්වය, මෙන්න මේ වගේ දේවල් ඔයා පැහැදිලිව සඳහන් කරන්න ඕන





**4. Languages –** මෙතන **English** කියන කොටස තමගෙ නිපුණතාව අනුව **Basic**(සාමාන්‍ය),**Conversational** (කතාකරන්න පුලුවන්), **Fluent**(නිපුණ), **Native**(මව් භාශාව) තෝරන්න. තව **Language** එකක් පුලුවන් නම් **Add new** කියන එක හරහා ඒවත් **Add** කරගන්න පුලුවන්. වෙනත් **Language** එකක් පුලුවන් එක අමතර වාසියක් **Russian, France, Italy** අයගෙන් **Orders** ගන්න.





**5. Tests Taken –** මේක ඔයාගෙ **skill** එක **test** කරන්න දාල තියෙන්නෙ. මේ කරන එකෙන් ඔයාට වැඩි විශ්වාසයක් දිනාගන්න පුලුවන් වගේම **services** ගන්න අයට ඔයාව මනින්න පුලුවන් මිම්මක්. ඒ නිසා මේ **test** කරන්න අමතක කරන්න එපා. මේකෙ **basic English test** එකක් හැමෝටම දාල තියනවා.ඒ වගේම ඔයාගෙ **service** එකට ගැලපෙන **test** තෝරගෙන කරන්න.







**6. Linked Accounts –** මේ කොටස හරහා ඔයාට පුලුවන් ඔයාගෙ **Facebook, Google** හා අනෙකුත් කරන්න.ඒ හරහා ඔයාට ඔයා ගැන වැඩි විස්තර පෙන්නන්න පුලුවන්.





**7. Skills, Education, Certification –** මේ කොටස් ටික තියෙන්නෙ ඔයාගෙ **Skills**(හැකියාවන්), **Education**(අධ්‍යාපනික සුදුසුකම්) හා **Certification**(සහතික) ඉදිරිපත් කරන්න.මේ හරහාත් ඔයාට වැඩි විශ්වාසයක් දිනාගන්න පුලුවන්.

## දැන් අපි සාර්ථකව Fiverr Account එක Create කරගත්ත.

දැන් අපි පොඩ්ඩක් බලමු මොනවද මේ **Fiverr Account** එකේ තියෙන **Levels** කියල.
**Levels 4 ක් තියනවා.**




## අපි බලමු මේ එක එක Level එකේ තියන විශේෂත්වය.




ඔයා **Fiverr** එකට ගිහින් මුලින්ම **GiG** එකක් හැදුවට පස්සෙ **New seller** කෙනෙක් විදිහට තමා **Register** වෙන්නෙ. මෙතනින් පස්සෙ ඔයා වැඩ කරන විදිහ අනුව තමා **Level up** වෙන්නෙ.

### Benefits –

- Active Gigs 7
- Gig extras 2 ($5, $10, $20)
- Gig multiples 5
- ඩොලර් **5,000** දක්වා **Custom offers** යවන්න පුලුවන්.
- එන සල්ලි දවස් **14** න් **Clear** වෙනවා.

sinhalaebooks.com

**Level One Seller**

මේකට ඔයා මූලික දේවල් කිහිපයක් සපුරන්න ඕන.අන්තිම දවස් 60 Fiverr එක ඔයාගෙ Account එක Review කරල බලනකොට ඔයාගෙ Performance හොඳ නම් Fiverr එක ඔයාව level up කරනව. මේකට ඔයා seller කෙනෙක් විදිහට දවස් 60 ක් complete කිරීම, සම්පූර්ණ orders 10 ක් complete කිරීම, 400$ ක වත් Earning එකක් තිබීම, දින 60 ක් තුල අවම 4.7 star rating එකක් තිබීම, දින 60 ක් තුල 90% ක response කිරීම, 90% ක order complete කිරීම, 90% ක on time deliver කිරීම හා දවස් 30 ක කාලයකදී warning කර නොතිබීම වැදගත් වෙනව.

## Benefits -

- Active Gigs 10
- Gig extras 4 ($5, $10, $20,40$)
- Gig multiples 10
- ඩොලර් 5,000 දක්වා Custom offers යවන්න පුලුවන්.
- එන සල්ලි දවස් 14 න් Clear වෙනවා.
- Promotions කරන්න පුලුවන්.

---

**Level Two Seller**

මේකට ඔයා seller කෙනෙක් විදිහට දවස් 120 ක් complete කිරීම, සම්පූර්ණ orders 50 ක් complete කිරීම, 2,000$ ක වත් Earning එකක් තිබීම, දින 60 ක් තුල අවම 4.7 star rating එකක් තිබීම, දින 60 ක් තුල 90% ක response කිරීම, 90% ක order complete කිරීම, 90% ක on time deliver කිරීම හා දවස් 30 ක කාලයකදී warning කර නොතිබීම වැදගත් වෙනව.

## Benefits -

- Active Gigs 20
- Gig extras 5 ($5, $10, $20,40$,50$)
- Gig multiples 15
- ඩොලර් 10,000 දක්වා Custom offers යවන්න පුලුවන්.
- එන සල්ලි දවස් 14 න් Clear වෙනවා.
- Promotions කරන්න පුලුවන්.
- Customer support එක වැඩි වෙනව.

---

**Top Rated Seller**

මේකට ඔයා seller කෙනෙක් විදිහට දවස් 180 ක් complete කිරීම, සම්පූර්ණ orders 100 ක් complete කිරීම, 20,000$ ක වත් Earning එකක් තිබීම, දින 60 ක් තුල අවම 4.7 star rating එකක් තිබීම, දින 60 ක් තුල 90% ක response කිරීම, 90% ක order complete කිරීම, 90% ක on time deliver කිරීම හා දවස් 30 ක කාලයකදී warning කර නොතිබීම වැදගත් වෙනව.

## Benefits -

- Active Gigs 30
- Gig extras 6 ($5, $10, $20,40$,50$,100$)
- Gig multiples 20
- ඩොලර් 10,000 දක්වා Custom offers යවන්න පුලුවන්.
- එන සල්ලි දවස් 7 න් Clear වෙනවා.
- Promotions කරන්න පුලුවන්.
- VIP Customer support

# GIG එකක් හදන්න කලින් මේ ටිකත් දැනගන්න.

1. මුලින්ම ඔයා හොයාගන්න ඕන වැඩියෙන්ම ඉල්ලුම තියන **GIGS** මොනවද කියල.ඒකට ඔයා **Fiverr** එකේ තියන **High Rating GIGS** මොනවද කියල **Search** කරල බලන්න ඕන.එතකොට ඔයාට **Idea** එකක් ගන්න පුලුවන්.

2. හදන **GIG** එක **Unique** වෙන්න ඕන. ඒ කියන්නෙ තමගෙම නිර්මාණයක් වෙන්න ඕන.අනිත් අයගෙන් **Ideas** අරගෙන ඔයාම **Creative** විදිහට **GIG** එක හදන්න ඕන.


3. **GIG** එකේ **Quality** එක අනුව තමා ඔයාට **Order** එකක් එනවද නැද්ද කියල තීරණය වෙන්නෙ. ඒ නිසා හොඳට වෙලාව අරගෙන කලබල නොවී නිවැර්දිව පැහැදිලිව **GIG** එක හදන්න, **Future Investment** එකක් කියල හිතල එක කරන්න.

4. ඔයාට පැය **2-3** ක් වගේ ඇතුලත **Deliver** කරන්න පුලුවන් **GIG** එකක් දාන්න පුලුවන්නම් ගොඩක් හොඳයි.


## නිවැරදිව GIG එක හදමු.

මුලින්ම ඔයාගෙ **Fiverr Account** එකට **Log** වෙලා, දකුණු පැත්තෙ උඩම **Switch to Selling** කියන එකට ගිහින්, උඩම තියන **GIGS** කියන එකට යන්න.




දැන් **Open** වෙන **Page** එකේ **Create a New GIG** කියන එක **Click** කරන්න




## දැන් අපි ඊළඟට කරන දේවල් ටික පිළිවෙලින් බලමු..





**1. GIG Title –** මෙතන ඔයා දෙන **Service** එක ගැන **Title** එකක් දෙන්න ඕන. හැබැයි ඒ එක මුලු **GIG** එක ගැනම **IDEA** එකක් එන **Short & Clear** එකක් වෙන්න ඕන. අපේ **Service** එක මොකක්ද කියල දැක්ක ගමන් අවබෝධ වෙන්නෙ ඕන.

උදාහරණයකට ඔයා **LOGO Design** කරන කෙනෙක් නම්, ඔයාට කියන්න පුලුවන් "මම නවීන වගේම සුපිරි **LOGO Design** කරනව කියල.එහෙනම් ඔයාට මේ විදිහට දාන්න පුලුවන්.

**"I will create modern and luxury logo design"**

**2. Category –** **GIG** එකට අදාල **category** එක නිවැරදිව කරන එක අනිවාර්යයෙන් කරන්න ඕන. ඒ වගේම **Sub category** එකත් නිවැරදිව **Fill** කරන්න ඕන. මේකෙන් තමා ඔයාගෙ **GIG** එක **Target audience** එකට නිවැරදිව පෙන්නන්නෙ. ඒ නිසා මේක ඔයාට **Orders** එන එක තීරණය කරන දෙයක්.

sinhalaebooks.com




**3. GIG METADATA –** මේකෙන් ඔයාගෙ **GIG** එක **create** කරන **Style** එක සහ **Final product** එක **deliver** කරන **File Format** එක තෝරන්න.

**4. Search TAGS –** **Fiverr** එකේ **search** කරන **Buyers** ලට නිවැරදිම **GIG** එක ලැබෙන්නෙ මේ **TAGS** වලින්. ඒ නිසා **TAGS** දාද්දි කල්පනාකාරී වෙන්නෙ ඕනෙ මොකද, හරි **TAGS** තිබ්බොත් විතරයි හරි **Buyer** ගාවට **GIG** එක යන්නෙ. මේකයි කරන්න තියෙන්නෙ ඔයා **Buyer** කියල හිතාගෙන ඔයා **GIG** එක **Search** කරයි කියල හිතෙන වචන **TAGS** විදිහට දාන්න.උපරිම **TAGS 5**ක් දාන්න පුලුවන් අවම **3**යි, **TAGS 5**ම දාන්න පුලුවන් නම් හොදයි.මොකද ඒක අපිට වාසී. උදාහරණයකට ඔයා **Logo Designing GIG** එකක් නන් හදන්නෙ මේ **TAGs use** කරන්න පුලුවන්.

| | | | |
|---|---|---|---|
| LUXURY | MODERN | CREATIVE | 3D |

## දැන් "Save & Continue" කරන්න.
## දැන් අපි ඇවිල්ල ඉන්නෙ Scope & Pricing කියන කොටසට.

**5. Scope & Pricing –** මේ කොටසින් ඔයාගෙ **GIG** එක **categories 3**කට බෙදන්න පුලුවන්, **Basic, Standard, Premium** කියල. මේකෙදි ඔයාල කරන්න ඕන **Basic** සිට **premium** දක්වා ඔයාලගෙ **GIG** එකෙන් කරන **Service** එකේ **quality** එක සහ **Additional facilities** වැඩි වෙන විදිහට.


උදාහරණයක් විදිහට **Basic** සිට **Premium** දක්වා **Delivery Time** එක **12hr, 24hr, 36hr** විදිහට දාන්න පුලුවන්. දැන් අපිට පුලුවන් වෙන්න ඕන තීරණය කරන්න අපේ **Service** එකත් එක්ක මේ තියන **option** වලින් මොනවද අපි දෙන්නෙ සහ නැත්තෙ කියල.

## Compare Packages

5

| Package | $15 **Basic** | $65 **Standard** | $115 **Premium** |
|---|---|---|---|
| | **BASIC LOGO DESIGN** 2 Basic Logos + Standard High Quality Mockup - NO COMPLEX OR MASCOT LOGO | **RECOMMENDED - MOST SELLING PACKAGE** 2 HQ UltraQuality Logos + AI EPS Vector Source File + 3D Mockup + VIP Support + 5 Social Media Cover | **COMPLETE PACKAGE - PERFECT NEED 4 U** 3 ULTIMATE Logos + AI - EPS PDF JPG PNG File + 3D Mock-up + 5 Social Media Cover + Stationery Design |
| Source File | — | ✔ | ✔ |
| Logo Transparency | ✔ | ✔ | ✔ |
| High Resolution | ✔ | ✔ | ✔ |
| 3D Mockup | — | ✔ | ✔ |
| Stationery Designs | — | — | ✔ |

| | | | |
|---|---|---|---|
| Social Media Kit | — | ✔ | ✔ |
| My Vector File | — | ✔ | ✔ |
| # of Initial Concepts Included | 2 | 2 | 3 |
| Revisions | 3 | 5 | Unlimited |
| Delivery Time | (●) 3 days<br>( ) 1 day (+$30) | 1 day | 1 day |
| Total | $15<br>Select | $65<br>Select | $115<br>Select |




ඔයාට අවශ්‍යනම් පුලුවන් **Add Extra Services** හරහා සමහර **options** අමතර මුදලක් අය කරල දෙන්න.හිතන්න අපි මොනවහරි **Item** එකක් **Customer** ට **ship** කරනව කියල ඒකෙ **Shipping Fee** එක අපිට පුලුවන් මෙතන **Add** කරන්න.ඊට අමතරව අමතර දෙනකොටත් මේක කරන්න පුලුවන්.

## දැන් "Save & Continue" කරන්න.
## දැන් අපි එන්නෙ Description & FAQ කියන කොටසට.

**6. Description & FAQ -** ඔයාගෙ **Description** එකෙන් තමයි **Buyer** තීරණය කරන්නෙ ඔයාට **Order** එකක් දෙනවද නැද්ද කියල. ඒ නිසා ඔයා හොදටම මේ **Description** එක හදන්න ඕනෙ, ඒ නිසා මේ දේවල් **Add** කරන්න **description** එක හදනකොට.

- මේ **GIG** එකෙන් කරන්නෙ මොකක්ද?
- ඕයාගෙ **GIG** එක කොහොමද අනිත් අයගෙ **GIG** වලින් වෙනස් වෙන්නෙ?
- **Buyer** ට ලැබෙන වාසි.
- ඔයාගෙ **service** එකේ තියන **quality** එක.

ඔයාට පුලුවන් **GIG Extras** ගැන එහෙමත් **Description** එකේ කියන්න. කොහොමහරි වෙන්නෙ ඕන **Buyer** ට ඔයාගෙ **Service** එක ගැන විශ්වාසයක් අතිවෙන එක මේ **Description** එක හරහා.

ඒකට ඔයා කරන්න ඕන ඔයා ඔයාගෙ **Field** එකේ පොරක් කියල පෙන්නන එක. ඒකට ඔයා **English** හොදට **use** කරන්න ඕන, ඒකට ඕනනම් වෙන කෙනෙක්ගෙන් **Support** එක ගන්න.

## About This Gig

6

**"Creating beautiful brand face, one at a time"**

**'We' 'Perfectionist'** is a highly talented and dedicated team, focused on providing unique logo design absolutely from scratch. A Logo is the face of your brand which is as equally important as the success of your business and we make sure to dig the pillars of your success from depth.

**Kindly select STANDARD or PREMIUM pack for best results similar to my portfolio.**

**Reasons that make our gig unique!**
✓Original, highly creative and conceptual design that clearly depict the brand's message
✓Swift, Reliable and Premium support
✓Unlimited Revisions(until you are satisfied)
✓Team of award-winning designers
✓All types of vector source files-AI EPS PDF PNG JPEG
✓and lot more

**Nothing Beats the Experience! Check out my live portfolio, Client's feedback and be assured**
Portfolio: https://flic.kr/s/aHskHuJvwS

Minimal Logo I Modern I Professional I Flat I Luxury I Text I Vintage I Badge I Feminine I Signature I Custom Design

**FAQS** කියන්නෙ **Buyers** ල වැඩිපුරම අහයි කියල හිතන ප්‍රශ්න අපි කලින් හිතල දාන එකට, මන් උදාහරණ කිහිපයක් දාල තියනව ඒකටත්.

## FAQ

What is included in $15 basic gig ? >

How Premium Package is Beneficial? >


What does '2 Logo Design mean' ? >

What is needed to get started ? >

What is Vector/Source file? >

## Description සහ FAQs යන දෙකම Complete කලා නම්, Save & Continue දෙන්න. දැන් ඔයා එන්නෙ Requirements කියන කොටසට.

**7. Requirements –** මේකෙ තියෙන්නෙ **Buyer** කෙනෙක් ඔයාගෙ **GIG** එක **Order** කරහම, එක **Complete** කරන්න **Buyer** ගෙන් ඕන දේවල් හා දැනගන්න ඕන දේවල්. මේ **Requirements** ගෙන් **Free text, Multiple answer** හා **Attached files** ලෙස ආකාර **3**කින් ගන්න පුලුවන්.





## මේ විදිහට මේ දේවල් Add කරල Save & Continue දෙන්නෙ පුලුවන් දැන් අපි එන්නෙ Gallery කියන කොටසට.

**8. Gallery –** මේ කොනතටසත් ඉතාම වැදගත් කොටසක්. මේකෙ ප්‍රධාන කොටස් **3**ක් තියනව **GIG Photos, GIG video, GIG PDFs** කියල.

ඔයාගෙ **GIG** එකට පෙනුම එන්නෙ මේ **Gallery** කියන කොටසින්, අපිට **Buyers** ල **Attract** කරගන්න ඕන නම් මේ කොටස් ටික ලස්සනට, පිලිවෙලට දාන්න ඕන.


sinhalaebooks.com





ඒකෙනුත් **Gig photos** වලට ප්‍රධාන තැනක් එනව. ඔයාට පුලුවන් **GIG photos 3**ක් දාන්න. මේ **Photos** වලින් ඔයාගෙ **Service** එක හොඳට කැපිල පේන්න ඕන, ඒ වගේම **High quality photos** කරන්න ඕන. ඔයාට පුලුවන් මේ ගැන **Idea** එකක් ගන්න **Fiverr** එකේ ඉන්න අනෙක් **Sellers** ලව **Study** කරන්න, ඊට පස්සෙ ඔයාටම **Identical Photos** ටිකක් **Create** කරගන්න.

මේ දාන **photos** වල **resolution** එක අවම **550 pixel * 370 pixel (Width & height)** වෙන්න ඕන, එක වැඩිවෙන තරමට හොඳයි.

ඒ වගේම **photos** වල **Format** එක **JPEG, JPG, PNG**වලින් තියෙන්න ඕන.





ඊලඟ කොටස තමයි **GIG video** එක. මේකෙන් පුලුවන් ඔයාගෙ **GIG** එකට **Buyers**ලා එන එක **40%** කින් වැඩි කරන්න.මොකද **Photos** කිහිපයකට වඩා එක **Video** එකකින් සම්පූර්ණ විස්තරයක් **Buyers**ලට දෙන්න පුලුවන්. ඒ නිසා මහන්සි වෙලා ලස්සනට, **Creative** විදිහට ඒ වගේම **High Quality Video** එකක් හදන්න.මේ **Video** එක තත්පර **75** කට සහ **50mb** වලට නොවැඩි විදිහට හදන්න.ඒ වගේම ඔයාල දාන එකට තියෙන්න ඕන.






ඊලඟට ඔයාල මේ **GIG** එක ගැන තව තියන**Details PDF** එකක් විදිහට දෙන්න පුලුවන්. ඒවගේම මතක තියාගන්න මේ **PDF** එකේ **Quality** එකත් ඔයාලට **Orders** එන්න බලපානව.

මේ දේවල් ටික ඔක්කොම කලානම්, මෙන්න මේ එකට එකක් දාන්න. මෙතනින් කියන්නෙ ඔයා මේ **Upload** කරපු දේවල් ඔයාම **Create** කරපු දේවල් කියල **Confirm** කරනව කියල සහ වෙනකෙනෙක්ගෙන් **copy** කරල නැහැ කියල. මේ නිසා ඔයාම **Create** කරපු දේවල් විතරක් මේකට දෙන්න.




**දැන් Save & Continue දෙන්න.**
**දැන් ඉතින් GIG එක හදල ඉවරයි. දැන් තියෙන්නෙ GIG එක Publish කරන්න.**
**ඒක Publish GIG කියන එක හරහා කරන්න පුලුවන්.**



**හරි අපි අපේ එක සාර්ථකව Publish කරා. දැන් අපි බලමු අපේ එක Publish කරාට පස්සෙ තියෙන්න පුලුවන් GIG status මොනවද කියල.**


- **Active -** මේ GIGs Fiverr එකේ Buyers ලට Buy කරන්න පුලුවන් විදිහට තියනව.
- **Pending Approval -** මේ කියන්නෙ මේ GIG එක Fiverr එකේ Approval එක හම්බ වෙනකන් තියනව කියන එක. බොහෝ වෙලවට මෙහෙම වෙන්නෙ ඔයා GIG එකට Video එකක් Upload කරල තියනවනම්.
- **Requires Modification -** මේ එක එකෙන් කරල තියෙන්නෙ එකෙ වෙනස්කමක් කරන්න අවශ්‍යවෙනව.
- **Draft -** හදල දැනට Publish කරල නැති GIGs
- **Denied -** ඔයාගෙ GIG එක Fiverr එකේ Policies සහ Requirements වලට අනුකූල නැති Video සහ විවිධ හේතු නිසා තමයි ඔයාගෙ GIG එකට මෙහෙම වෙන්නෙ.
- **Paused -** මේ GIGs දැනට ඔයාට available නැහැ. නමුත් Fiverr එකෙන් Approve කරගෙන Publish කරන්න පුලුවන්.

## ඔබේ GIG එක Ranking වල උඩට ගමු.


ඇත්තටම GIG එකක් හදල Publish කලා කියල දවසින් දෙකෙන් අපිට Orders එන්නෙ නෑ. ඒකට අපි ටිකක් මොලේ පාවිච්චි කරන්න ඕන. Impressions, Clicks, Views, Orders, Positive reviews නැතුව අපිට Orders ගන්න අමාරුයි. ඒකට කරන්න තියෙන්නෙ මේ දේවල් අපිම අපේ එකට අරන් දෙන එක. ඒකට ඔයාට පුලුවන් Dummy Fiverr account එකක් Create කරගෙන ඔයාගෙ GIG එක දෙපාරක් BUY කරන්න.ඊට පස්සෙ හොද Positive review දෙකක් දෙන්න පුලුවන් ඔයාගෙ GIG එකට.

## Order එක නිවැරදිව Deliver කරමු.

Buyer කෙනෙක්ගෙන් ඔයාට Order එකක් ආපුවහම Email එකකින් ඒක දැනුම් දෙනව, ඒ වගේම Order ඒක Fiverr එකෙනුත් බලාගන්න පුලුවන්.




**Buyer Order** එක දාල, **Order requirements Submit** කරාට පස්සෙ **Order** එක **Deliver** කරන්න තියන වෙලාව **Countdown** වෙන්නෙ පටන් ගන්නව. ඔයා අන්තිම වෙනකන් ඉන්න එපා පුලුවන්තරම් ඉක්මනට **Order** එක **Deliver** කරන්න.





මුලින්ම ඔයාල කරන්න ඕන **Buyer** එවපු **Details** හොදට කියවන එක, ඊටපස්සෙ ඒ **Details** මදිනම් ඔයාට පුලුවන් **Buyer**ට **Message** එකක් දාල අමතර **Details** ඉක්මනට ඉල්ලගන්න. මොකද හොද **Order** එකක් **Deliver** කරන්න **Buyer**ගෙ **Requirements** හොදට අවබෝධකරගන්න ඕන

sinhalaebooks.com

Buyer කියපු විදිහට Order එක Complete කරල Deliver Now කියන එක හරහා Buyer ට Order එක යවන්න. ඊටපස්සෙ ඔයා හොදට Service එක දුන්නනම් Buyer ට කියන්න ඔයාට 5 star rating එකක් එක්ක හොද Feedback එකක් දෙන්න කියල.

fiverr®

## හොයපු සල්ලි අතට ගමු.




දැන් අපි හිතමුකො කොහොමහරි සල්ලි හෙව්ව කියල, කොහොමද සල්ලි Withdraw කරන්නෙ. ඒකට ඔයාල යන්න ඕන Earnings කියන කොටසට. එතන Available for withdraw විදිහට තියන amount එක ඔයාට withdraw කරන්න පුලුවන්.
ඔයාට එතන ක්‍රම 3 ක් තියනව සල්ලි Withdraw කරන්න පුලුවන්.

**Paypal Account** - ඔයාට පුලුවන් ඔයාගෙ Paypal Account එක Fiverr එකට Link කරල සල්ලි Withdraw කරන්න. ඒකට ඔයාලට Paypal Account එකක් තියෙන්න ඕන.

**Bank Transfer**

**Fiverr Revenue Card** - Fiverr Revenue card එක කියන්නෙ Payoneer Card එකටම තමයි. වෙනසකට තියෙන්නෙ ඒක සමඟ සම්බන්ධ වෙලා තියන එක. ඔයාට දැනට Card එකක් නැත්නන් Fiverr හරහා අලුතෙන්ම එකක් Apply කරන්න පුලුවන්

sinhalaebooks.com

# සාර්ථක වෙන්න TIPS ටිකක්.

- හැමතිස්සෙම **Creative** විදිහට හිතල අලුත් දෙයක් කරන්න


- **Order** එක පුලුවන් තරම් ඉක්මනට **Buyer** ට **Deliver** කරන්න. **Messages** වලට ඉක්මනට **Reply** කරන්න.

- **Buyer** ට හොඳට කතා කරන්න, ආචාරශීලීව උත්තර දෙන්න. එයාගෙන් අහන්න ඔයාට තව උදවු ඕනද කියල, ඒ වගේම එයාගෙ ඉදිරි වැඩ ගැනත් අහන්න ඒවත් එතකොට දෙන්න ඉඩතියනව.

- **Fiverr forum** එක **Use** කරන්න ඒකෙ ඉගනගන්න දේවල් තියනව.

- හැකිතරම් **Online** ඉන්න ඒකෙනුත් **Orders** වැඩිවෙන්නෙ ලොකු ඉඩක් තියනව.

- **Mutual Cancelation**




මේකෙන් වෙන්නෙ ඇත්තටම ඔයාට කරන්න බැරි **Order** එකක් ආවොත්, නැත්නත් වෙලාවට **Order** එක දෙන්න බැරිනත් ඔයාට **Buyer** එක්ක කතා කරල **Order** එක **Cancel** කරන්න දීල තියන **Option** එකක්.

මෙහෙම වෙලාවක **Buyer** ගෙන් **Negative Feedback** එකක් ගන්නවට වඩා මේ විදිහට ප්‍රශ්නෙ විසඳගන්න පුලුවන්න නම් හොඳයි.

මේකෙදි අදාල **Reason** එක දාල **Buyer** ට **Request** එකක් යවනව **Order** එක **Cancel** කරන්න කියල, **Buyer** ඒක **Accept** කරහම **Cancelation** එක **Approve** වෙලා **Refund** එක යනව.

මේකට **Orders** වල **Visit the Resolution center** වලට යන්න ඕන.

- **Order** එකත් එක්ක තව **Bonus** මොනවහරි දෙන්න පුලුවන්නම් **Buyer** එක්ක තියන හිතවත්කම වැඩි කරගන්න පුලුවන්, ඒ හරහා තව **Orders** ගන්නත් පුලුවන්.

sinhalaebooks.com

# Fiverr වලින් සල්ලි හොයන ක්‍රම 36ක්




ඔයාලට කරන්න තියෙන්නෙ මම සඳහන් කරල තියන **Services Fiverr** එකේ **search** කරල ඒ **Sellers** ල කොහොමද ඒ **Service** එක දෙන්නෙ සහ කොහොමද **GIGs** හදල තියෙන්නෙ කියල **study** කරන එක. ඊටපස්සෙ ඔයාල **decide** කරන්න ඔයාල මොනවද කරන්නෙ කියල.

- Write articles or blog posts
- Edit articles or blog posts
- Write resumes and cover letters
- Write product descriptions
- Write headlines
- Write letters/emails
- Offer your handwriting services (thank you notes, greeting cards, etc.)
- Critique websites
- SEO help
- Do keyword research for people looking to improve their website SEO
- Turn photographs into paintings/digital images
- Create or modify spreadsheets
- Design logos and banners
- Design e-book covers
- Design business cards
- Edit/retouch images
- Make crafts
- Send video messages
- Paint/draw pictures
- Share links/promos to your Facebook or Twitter followers (works best if you have tons of followers)
- Help people get Facebook or Twitter followers
- Create video advertisements
- Help troubleshoot website problems
- Help people set up their websites
- Translation
- Interpretation
- Transcribe audio files
- Post advertisements to Craigslist and other sites online
- Help others with homework/essays
- Give advice (the sky is the limit here — what are you qualified to give advice about?)
- Help people brainstorm – come up with ideas
- Create PDF files
- Get rid of computer viruses or malware
- Sing songs on video or audio for others
- Create music for others using your talent (guitar, piano, etc.)
- Do voice overs/voice acting
- Write songs or jingles
- Master audio tracks
- Do research
- Teach lessons

sinhalaebooks.com

JOIN WITH FIRST AND

# MOST TRUSTED ACADEMY

FOR ONLINE ENTREPRENEURS IN SRI LANKA

attrex academy

We have built hundreds and thousands of successful digital entrepreneurs in Sri Lanka since 2008

www.fb.com/attrexacademy

www.attrexacademy.com

info@attrexacademy.com

0710667728 | 0117952020

#33, Sir Soratha Mawatha, Wijerama , Nugegoda

95/A, Negombo Road, Kandana, 11320 Kandana

312/1/1, Nupe Junction, Matara

Created by

**Pasindu Sooriarachchi** - Attrex Academy

100% Free Distribution

Copyright Attrex Academy | 100% Free Distribution | 100% නොමිලේ බෙදාහැරීම සඳහා